# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය දෙවන වාරය

➢ හරි නම් ( √ ) ලකුණ ද වැරදිනම් ( X ) ලකුණ ද වරහන් තුළ ලියන්න

1. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු ත්‍රිලක්ෂණ ධර්මයන් ය. (.....)
2. අනාත්ම යන්නෙන් අදහස් වන්නේ නිත්‍ය වූ, ස්ථිර වූ, නොවෙනස් ව පවතින ආත්මයක් හෙවත් මම යැයි ගත හැකි පදාර්ථයක් ඇති බවයි. (.....)
3. අනිත්‍ය යනු වෙනස් වීමයි, කැඩෙන බිඳෙන සුලු බවයි, මෙම කැඩෙන බිඳෙන සුලු බවය බුදු දහමේ ලෝක යනුවෙන් හැඳින්වේ. (.....)
4. සැපදායක යැයි සලකන සියලු වින්දනයන් ස්ථිරය. (.....)
5. බුදුරජාණන් වහන්සේ තම මංගල ධර්ම දේශනාවේ දී දුක්ඛ ආර්ය සත්‍ය පිළිබඳව දේශනා කර ඇත. (.....)
6. තිලකුණු දන්නා තැනැත්තා අටලෝ දහමින් අකම්පිත වෙයි. (.....)
7. ප්‍රඥාව ලෙස හැඳින්වෙන්නේ ත්‍රිලක්ෂණ අවබෝධය යි. (.....)
8. සියලු කෙලෙස් උපදින්නේ අනාත්ම දෘෂ්ටිය නිසාය. (.....)

## පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. ත්‍රිලක්ෂණය හඳුන්වන්න.
2. පංචස්කන්ධය නාම රූප වශයෙන් වෙන් කොට දක්වන්න.
3. බුදුරජාණන් වහන්සේ නාම රූප ධර්ම වල අනිත්‍යතාව පැහැදිලි කරීම සඳහා දක්වා ඇති උදාහරණ මොනවාද?
4. බුදුරජාණන් වහන්සේ දුක්ඛ සත්‍යයෙහි සත්ත්වයාට මුහුණපාන්නට සිදුවන දුක් දක්වා ඇත්තේ කෙසේ ද?
5. ත්‍රිලක්ෂණය ගැන අවබෝධයෙන් යුතු පුද්ගලයාට මෙලොව ජීවිතයේ දී ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න.

සැකසුම :- ඒ.වී.චමින්ද විජේකුමාර ආරියදාය මයා කෑ /දෙහි /සීපෝත් සේනානායක ක.වි